**පිළිතුරු පත්‍රය**
**Marking Scheme**

| | | |
|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: **ඉතිහාසය** | පත්‍රය / வினாத்தாள் / **Paper**: **I,II** |

## ඉතිහාසය I

| | | | |
|---|---|---|---|
| (1) 4 | (11) 2 | (21) 3 | (31) 3 |
| (2) 1 | (12) 2 | (22) 3 | (32) 1 |
| (3) 3 | (13) 4 | (23) 4 | (33) 1 |
| (4) 2 | (14) 1 | (24) 1 | (34) 4 |
| (5) 3 | (15) 4 | (25) 3 | (35) 2 |
| (6) 2 | (16) 3 | (26) 1 | (36) 2 |
| (7) 2 | (17) 1 | (27) 3 | (37) 2 |
| (8) 4 | (18) 3 | (28) 4 | (38) 4 |
| (9) 3 | (19) 2 | (29) 4 | (39) 1 |
| (10) 4 | (20) 4 | (30) 1 | (40) 1 |

## ඉතිහාසය II

(01) (අ) (i) , (ii) ලංකා, ලෝක සිතියම් ලකුණු කර දක්වා ඇත.

(ආ) (i) A. හෝමෝ සාපියන්
B. පළමුවන කාශ්‍යප (සීගිරි කාශ්‍යප) රජතුමා
C. ස්පිල් බර්ජන්
D. රොබට් බ්‍රවුන්රිග්

(ii) 1. ගල්පොත ශිලා ලේඛනය 2. පොළොන්නරුව
3. නිශ්ශංකමල්ල රජතුමා 4. කළුගල්

(iii) 1. දුරකථනය
2. ඇලෙක්සැන්ඩර් ග්‍රැහැම්බෙල්
3. සන්නිවේදන ක්ෂේත්‍රය
4. විදුලි පණිවුඩ ක්‍රමය/ ගුවන්විදුලි යන්ත්‍රය/ රූපවාහිනිය

(02) (i) අර්ධ ශුෂ්ක කලාපය / පහතරට වියළි කලාපය / පහතරට අතරමැදි වියළි කලාපය / තෙත් කලාපය / කඳුකර වියළි අතරමැදි කලාපය / ශුෂ්ක කලාපය

(ii) පිළිස්සූ මැටි වළං භාවිතය, ක්‍රමවත් සුසාන චාරිත්‍ර විධි, යකඩ ලෝහ භාවිතය, ස්ථිරවාසී වීම, කෘෂිකර්මාන්තයට යොමුවීම

(iii)
- මිනිස් හිස් කබලේ දෙකට බෙදෙන ලෙස සිදුරු විදීම
- හිස් කබලේ රළුවට පිහිටා තිබුණු දාර සහ පිටතට නෙරා තිබෙන කොටස් ගලක උලා මට්ටම් කර එක් පැත්තක රතු ගුරුගල් ආලේප කිරීම
- මෙවැනි අභිචාර විධි රාවණා ඇල්ල ලෙන ආශ්‍රිත කැනීවලින් සොයා ගැනීම
- රතු පැහැති ගුරුගල් ආලේප කළ මිනිස් ඇට සැකිළි පාහියංගල ලෙනින් හමුවීම

- ඇටසැකිළි නමා වකුටු කර වළලා තිබුණු බවට සාක්ෂි කුරුවිට බටදොඹලෙනින් හමුවීම

(iv)
- කුඩා ගම් වැව් ව්‍යාප්තව පැවතීම
- වැව් බැම්මේ එක් කෙළවරක වැවට නුදුරුව ගම් වැව් පිහිටීම
- වෘත්තීන් හා කාර්යයන් පදනම් කරගෙන ජනාවාස බිහිවීම (කසීකාරගාම, නියම්ගම්)
- ගම් කුඩා කැලෑ රොදකින් වෙන්වීම
- වැටකින් ආරක්ෂා වූ ගම් හා එසේ නොමැති ගම් තිබීම
- වැවක් කේන්ද්‍ර කොට ගෙන පිහිටි වාපීගාම පැවතීම (සුමනවාපී ගාම , කඩහවාපීගාම...)
- ගමික ගමේ ප්‍රධානියා වීම
- ගමක පවුල් 5-6 සිට 30 දක්වා පැවතීම
- විශාල නාගරික ජනාවාස බිහිවීම (පුර ලෙස හැඳින්වීම)

(03) (i) A - යාපහුව B - ගොවින්දමලය C - ගංදෙනිය

(ii) A - දළඳා සිරිත, පන්සිය පනස් ජාතක පොත

B - බුදුගුණාලංකාරය, ලෝවැඩ සඟරාව

(iii)
- චන්ද්‍රභානුගේ ආක්‍රමණ දෙකට ම සාර්ථකව මුහුණදීම
- මාඝගේ පාලනයෙන් රජරට මුදවා ගැනීම කරුණු දෙක විස්තර කිරීම

(iv)
- කෘෂිකාර්මික කටයුතු සඳහා අහස්දිය යොදා ගැනීම
- වාණිජ ආර්ථික රටාවකට නැඹුරුවීම
- වනගතව වැවුණු කුරුඳු ප්‍රධාන වෙළඳ බෝගය වීම
- පුවක්, ගම්මිරිස්, එනසාල්, සාදික්කා වැනි බෝගවල අතිරික්තය වෙළඳාම
- මුතු, මැණික් ඇතුන්, ඇත්දළ ආදිය වෙළඳාම
- ඉන්දියාව, අරාබිය, චීනය, පර්සියාව, ඊජිප්තුව වැනි රටවල් සමඟ වෙළඳ සබඳතා පැවැත්වීම
  කරුණු තුනක් පැහැදිලි කිරීම

(04) (i) සෙංකඩගල, උඩරට රාජධානිය, කන්දෙ නුවර

(ii) A හැඳ බද්ද B මඩිගේ බද්ද

C බඩහැල බද්ද D කුරුවෙ බද්ද

(iii)
- ස්වයංපෝෂිත ආර්ථික රටාව සහ පරිභෝජනය මත පදනම් වීම
- වී වගාව සීමිත වීම සහ හෙල්මළු වගාව
- වැඩි ඉඩම් ප්‍රමාණයක් හේන් ගොවිතැනට යෙදවීම
- කුරක්කන්, අමු, මෙනේරි වැනි ධාන්‍ය සහ අල, බතල වගාව
- ගෙවතු ආශ්‍රිතව කොස්, දෙල්, පුවක්, එළවළු, පලතුරු සහ කුළුබඩු වර්ග වගාව
- යකඩ දුව, ලෝහ, පන්, ලාක්ෂා වැනි කර්මාන්ත
- කෘෂිකාර්මික කටයුතු හා කිරි ලබා ගැනීම සඳහා සත්ත්ව පාලනය වැනි කරුණු දෙකක් විස්තර කිරීම

(iv)
- පෘතුගීසින්ගෙන් උඩරටට එල්ලවන ප්‍රහාර මැඩ පැවැත්වීම
- පෘතුගීසින් මෙරටින් පලවා හැරීම
- උඩරට රදළ ප්‍රධානින්ගෙන් එල්ල වූ තර්ජන අවම කර ගැනීම
- ලන්දේසි බලපෑමෙන් උඩරට නිදහස් කර ගැනීම

- අභියෝග තුනක් නම් කිරීම හා ඉන් එක් අභියෝගයක් විස්තර කිරීම

(05) i. කෝට්ටේ, උඩරට, යාපනය

ii. - සීතාවක පාලකයන් නිරන්තර යුද්ධයක නියැලීම
- පළමුවන රාජසිංහ රජු අනුගමනය කළ බෞද්ධ විරෝධී ප්‍රතිපත්ති
- වීර සුන්දර බණ්ඩාර මැරවීම නිසා උඩරට ජනතාවගේ සහයෝගය රජුට අහිමිවීම
- වීර සුන්දර බණ්ඩාරගේ පුත් කොනප්පු බණ්ඩාර උඩරට රජවීම
- පළමුවන රාජසිංහ රජුගෙන් පසුව රාජධානියට නිසි උරුමකරුවෙක් නොසිටීම

මින් කරුණු දෙකක් ලිවීම

iii. - උඩරට ජනතාව සෑම විටම රජුට සහාය දීම
- උඩරැටියන්ගේ සටන් උපක්‍රම හා රජවරුන්ගේ උපාය කෞශල්‍යය
- පෘතුගීසින් වෙනුවෙන් සටන් කිරීමට ගිය පහත රැටියන් උඩරට දී රජුට එකතු වීම
- උඩරට රාජධානියේ ස්වාභාවික පිහිටීම මෙවැනි හේතු දෙකක් විස්තර කිරීම

(iv) - කුරුඳු වගා කිරීම හා කුරුඳු වගාව ආරක්ෂා කිරීමට කටයුතු කිරීම
- උක්, කෝපි, කපු ආදී බෝග වගා කිරීම
- පහතරට ඇතැම් ප්‍රදේශවල වී වගාව දියුණු කිරීමට කටයුතු කිරීම
- රජු සමග ගැටුම් ඇති වූ විට උඩරට හා පහතරට අතර කඩවත් වසා දැමීම
- උඩරට රජු වෙනත් විදේශිකයින් සමඟ වෙළඳ සබඳතා පැවැත්වීම හැකි තරම් අවහිර කිරීම
- හැමිල්ටන් ඇළ වැනි ඇළ මාර්ග ඉදිකොට ඒවා භාණ්ඩ ප්‍රවාහනයට යොදා ගැනීම
- විශ්‍රාම ගිය නිලධාරින්ට ඉඩම් ලබා දී වගාවට යොමු කිරීම

මෙවැනි ක්‍රියාමාර්ග තුනක් විස්තර කිරීම

(06) (i) A මැක්ඩෝවල් B පිළිමතලව්වේ C ජෝන් ඩොයිලි

(ii) - ශ්‍රී ලංකාවේ පිහිටීම
- කුරුඳු ඇතුළු වටිනා වෙළඳ ද්‍රව්‍ය ලබා ගැනීම

(iii) - ස්වදේශීය නිලධාරින් නොසලකා හැර මදුරාසි නිලධාරින් බදු එකතු කිරීමට යෙදවීම
- මෙරට සම්ප්‍රදාය සංස්කෘතිය ස්වදේශීය භාෂාව පිළිබඳ ඔවුන්ට අවබෝධයක් නොතිබීම
- පාලන අධිකාරිය හා මහජනතාව අතර සබඳතාව දුරස්වීම
- උපරිම ලාභ ලබා ගැනීමේ අරමුණින් මුහුදුබඩ ප්‍රදේශවලට අළුත් බදු වර්ග පැනවීම
- බදු මුදලින් ම ගෙවීමට නියම කිරීම

(iv) - උඩරට ස්වාධීන රාජ්‍යයක් පැවතීම මුහුදුබඩ ප්‍රදේශවල ඉංග්‍රීසි පාලනයට බාධාවක් වීම
- අභ්‍යන්තර දේශ සීමා ආරක්ෂාවට හා වෙරළබඩ ප්‍රදේශ ආරක්ෂා කිරීමට හමුදා කාණ්ඩ දෙකක් යෙදවීම නිසා යුධ වියදම් වැඩිවීම
- මුහුදුබඩ ප්‍රදේශවල වැසියන් පවා තම රජු ලෙස උඩරට රජුට සැලකීම
- මුහුදුබඩ ප්‍රදේශවල ඉංග්‍රීසින්ට විරුද්ධව ඇතිවන කැරලිවල දී උඩරට රජු කැරලිකරුවන්ට ආධාර දීම
- කොළඹ පාලන මධ්‍යස්ථානය හා ත්‍රිකුණාමලය නාවික මධ්‍යස්ථානය අතර ගොඩබිමෙන් සබඳතා

පැවැත්වීමට මාර්ගයක් සකස් කිරීමේ අවශ්‍යතාව

- උඩරට රජු ප්‍රංශ ජාතීන්ගේ ආධාර ඉල්ලා සිටියැයි සැක මතුවීම මෙවැනි කරුණු තුනක් විස්තර කිරීම

(07) (i) මාසික තෑග්ග, ලංකා නිධානය, උරගල

(ii) A මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි B සිද්දිලෙබ්බෙ මහතා

C වලිසිංහ හරිස්චන්ද්‍රතුමා D පරම විඥානාර්ථ සමාගම

(iii)
- අනගාරික ධර්මපාලතුමා, පියදාස සිරිසේන මහතා, ජෝන් ද සිල්වා මහතා, ඩී. බී. ජයතිලක මහතා, ආතර් වී දියෙස්, ඒ. ආර්. සේනානායක මහතා, එඩ්වින් හේවාවිතාරණ මහතා මින් දෙදෙනෙකු නම් කිරීම
- මද්‍යසාර භාවිතයේ අහිසි ප්‍රතිඵල විවිධ මාධ්‍ය මඟින් ජනතාව දැනුවත් කිරීම (දේශන, පුවත්පත්, නාට්‍ය, නවකතා)
- රජයේ සුරාබදු ප්‍රතිපත්තියට එරෙහි උද්ඝෝෂණ
- කොළඹ මධ්‍යම අමද්‍යප සභාව පිහිටුවා රටපුරා ශාඛා ආරම්භ කර අමද්‍යප සමිති ජාලයක් ගොඩ නැඟීම

මෙවැනි කරුණු විස්තර කිරීම

(iv)
- ආරුමුගනාවලර්තුමාගේ සේවාවන්
- පොන්නම්බලම් රාමනාදන් මහතාගේ සේවාවන්
- පොන්නම්බලම් අරුණාචලම් මහතාගේ සේවාවන් පිළිබඳ විස්තර කිරීම

(08) (i) ප්‍රංශය, පෘතුගාලය, ස්පාඤ්ඤය, ජර්මනිය......

(ii)
- කර්මාන්ත සඳහා මුදල් ආයෝජනය කළ හැකි ධනවතුන් සිටීම
- යකඩ හා වානේ, ගල් අඟුරු වැනි ඛනිජ සම්පත් පැවතීම
- ජනගහන වර්ධනය සමඟ භාණ්ඩවලට ඉල්ලුම වැඩිවීම
- බ්‍රිතාන්‍ය යටත් විජිතවලට අවශ්‍ය භාණ්ඩයන් ද බ්‍රිතාන්‍යයෙන් ම ආනයනය කිරීමට සිදුවීම
- ඉඩම් කොටුකිරීමේ ව්‍යාපාරය
- එරට පැවති නිදහස් සමාජ පසුබිම
- අතිරික්ත ශ්‍රමය කාර්මික දියුණුවට යොදාගත හැකිවීම
- බ්‍රිතාන්‍යයේ පැවති දේශපාලන ස්ථාවරත්වය
- කර්මාන්ත හා ව්‍යාපාර සඳහා ප්‍රාග්ධනය සපයන බැංකු හා මූල්‍ය ආයතන බිහිවීම
- බ්‍රිතාන්‍යය තුළ කාර්මික විප්ලවය සඳහා සුදුසු පසුබිමක් පැවතීම (කුඩා දිවයිනක් වීම වැනි කරුණු)

මෙවැනි කරුණු දෙකක් ලිවීම

(iii)
- මහා පරිමාණ ගොවිබිම් ආරම්භ වීම
- ශෂ්‍ය මාරු ක්‍රමය
- සත්ත්ව පාලන කටයුතු සඳහා නව තාක්ෂණය භාවිතය
- නව කෘෂිකාර්මික ක්‍රම හා උපකරණ භාවිතය

මෙවැනි කරුණු දෙකක් උදාහරණ සහිතව විස්තර කිරීම

(iv)
- ජල දූෂණය (ජල මූලාශ්‍ර විනාශය)
- වායු දූෂණය (කර්මාන්ත, වාහන දුම්)
- ගොඩබිම දූෂණය (කැළිකසළ) ආදී කරුණු උදාහරණ තුනක් සහිතව පැහැදිලි කිරීම

(09) (i) මෙඩිසි, පියෙටා, මෝසෙස්, දාවිත් යන ප්‍රතිමා

(ii) A. අයිසෙක් නිව්ටන්

B. ගැලීලියෝ ගැලිලි

C. ජොහැන්නස් කෙප්ලර්

D. විලියම් හාවේ

(iii) දේශපාලන

- ජාතික රාජ්‍ය බිහිවීම
- මධ්‍යම පන්තියක් බිහිවීම
- වෙළඳ කටයුතු සඳහා රාජ්‍ය අනුග්‍රහය

ආර්ථික


- ස්වයංපෝෂිත ආර්ථික ක්‍රමය පරිහානියට පත්වීම
- යුරෝපා රටවල ජාතික වෙළඳ ප්‍රතිපත්ති, ජාතික බදු ප්‍රතිපත්ති ක්‍රියාත්මක වීම
- නව මුහුදු මාර්ග ඔස්සේ වෙනත් මහාද්වීපවලට පැමිණ වෙලඳ ද්‍රව්‍ය යුරෝපයට රැගෙන යාම
- මුදල් භාවිතය වැඩිවීම මෙවැනි කරුණු දෙකක් විස්තර කිරීම


(iv) දේශපාලන ක්ෂේත්‍රය

- පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය
- සාම්ප්‍රදායික නිලධාරීන් වෙනුවට නව නිලධාරී පන්තිය
- රෝම ලන්දේසි නීතිය මෙරටට හඳුන්වා දීම
- අධිකරණ පද්ධතිය ස්ථාපිත කිරීම

ආර්ථික ක්ෂේත්‍රය

- ව්‍යාපාරික වතු බෝග වගාව
- ආනයන අපනයන ආර්ථිකය
- මධ්‍යම පන්තියක් බිහිවීම
- දේශපාලන හා ආර්ථික ක්ෂේත්‍රයට අදාලව කරුණු තුනක් විස්තර කිරීම


N
පල්ලවවංක
කෝනේශ්වරම්
කලාවැව
කොළඹ
මාගම


ප්‍රංශය
වැනීසිය
කල්කටා
පොන්ඩිචේරි
බතාවිය